# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2307/17 - 2022 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2022.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### නවගත්තේගම ප්‍රාදේශීය සභාව

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැළසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ 2022.07.04 දින හා අංක 2287/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබූ නිවේදනයේ ඇතුළත් උපලේඛනයේ නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු විය යුතු ලෙස සලකනු ලැබූ පාරවල් සහ පටු මාවත් අතරින්, එකී නිවේදනයෙන් නියමකර ඇති දිනයට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා නැති පාරවල් හා පටු මාවත් සහ එකී දිනට පෙර නිසි අධිකරණයක නඩුවක් පවරා තිබී, එම අධිකරණය විසින් දෙන ලද තීන්දු ප්‍රකාර ප්‍රාදේශිය සභාව සතු විය යුතු ලෙස සලකනු ලබන බවට තහවුරු කරන ලද පාරවල් සහ පටු මාවත් සියල්ලම නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු විය යුතු බවට 2022.10.13 දින පවත්වනු ලැබූ මහ සභාවේ අංක 529 යටතේ සම්මත කරනු ලැබ ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ. එකී පාරවල් හා පටු මාවත් පිළිබඳ නාම ලේඛනයක් මෙහි උපලේඛනයේ ඇතුළත් කර ඇති අතර එහි ඇතුළත් සෑම පාරක්ම සහ පටු මාවතක් ම, ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තියේ (5) උප වගන්තිය යටතේ නවගත්තේගම ප්‍රාදේශිය සභාව සතු කරනු ලැබ ඇති පාරවල් සහ පටු මාවත් ලෙස සලකනු ලැබිය යුතු බව වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

**එස්. එම්. අයි. සේනාධිපති,**
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2022 ඔක්තෝබර් මස 26 වන දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1A - PG 6056 — 07 (2022/11)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### යෝජනාව

වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2238/35 සහ 2021 ජූලි මස 30 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වයඹ පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැළසුම් පිළියෙල කිරීම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පළ කිරීම පිළිබඳ නියෝග මාලාවෙහි කරන ලද නියම සහ 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ 2022.10.13 වන දින පවත්වනු ලැබූ නවගත්තේගම ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 529 දරන තීරණය අනුව 2022.07.04 දින අංක 2287/06 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබ ඇති නිවේදනයේ උපලේඛනයේ ඇතුළත් නාම ලේඛනයේ දැක්වෙන පාරවල් හා පටු මාවත් අතරින් තිසි අධිකරණයේ නඩු පවරා නැති සහ මෙහි පහත උපලේඛනයේ ඇතුළත් පාරවල් සහ පටු මාවත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව සතු පාරවල් සහ පටු මාවත් වශයෙන් තහවුරු කළ යුතු බව නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

EOG 11 - 0240

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.